**06 ශ්‍රේණිය**

# පළමු වාර පරීක්ෂණය - 2019 මාර්තු

**ගණිතය** | කාලය පැය 2 යි.


නම/විභාග අංකය :

## I කොටස

**(එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් හිමිවේ.)**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(01) දී ඇති වෘත්තයේ, වෘත්තය මත A ලක්ෂ්‍යය ද වෘත්තය තුළ B ලක්ෂ්‍යය ද ලකුණු කරන්න.



(02) සුළු කරන්න. $72 \times 23$

(03) පෙ.ව. 12.45 සම්මත ආකාරයෙන් ලියන්න.

(04) තිරස් බව මැනීමට හා සිරස් බව මැනීමට භාවිතා කරන උපකරණය බැගින් ලියන්න.

(05) පහත සංඛ්‍යා රේඛාව මත නිරූපණය කර ඇති සංඛ්‍යා අවරෝහණ පිළිවෙලට ලියන්න.





(06) 6502178

i) කලාපවලට වෙන් කර ලියන්න.


ii) සංඛ්‍යා නාමය ලියන්න.

(07) හිස් කොටුවට ගැලපෙන දිශාව ලියන්න.




(08) පන්තියක ළමුන් සංඛ්‍යාව ආසන්න 10 ට වැටයූ විට 50ක් විය. පන්තියේ ළමුන් විය හැකි කුඩාම හා විශාලම අගය ලියන්න.

(09) තත්පර 240 මිනිත්තුවලින් ලියන්න.

(10) 


පහත රූපයේ විජීය සංකේත මඟින් දක්වා ඇති කෝණ වර්ගය ලියන්න.

a -

b -

---

(11) රාක්කයක උස 20 cm කි. පොතක ඝනකම 15mm කි. එකමත එක තැබිය හැකි උපරිම පොත් ගණන නිමානය කරන්න.

---

(12) සෘජු කෝණයක් හා මහා කෝණයක් එකතු කළ විට ලැබෙන කෝණ වර්ගය කුමක් ද?

---

(13) පහන්ට 5m ක් උතුරින් සහන් සිටියි. සහන්ට 5m ක් නැගෙනහිරින් කවිඳු සිටියි. පහන්ට කුමන දිශාවකින් කවිඳු සිටීද?

---

(14) බස් රථයක් පෙ.ව. 10.45 ට ගමන් ආරම්භ කර ප.ව. 1.30 ට ගමන අවසන් කළේ නම් බස් රථය ධාවනය වූ කාලය සොයන්න.

---

(15) හිස්තැනට සුදුසු සංඛ්‍යාව ලියන්න.

```
  779
+ ......
  1000
```

---

(16) -3 ත් 2 ත් අතර ඇති නිඛිල සංඛ්‍යා ලියන්න.

---

(17) තුන් මිලියන පහ ඉලක්කමෙන් ලියන්න.

---

(18) 695 යන සංඛ්‍යාවට පෙර සංඛ්‍යාව ගණක රාමුවක් තුළ නිරූපණය කරන්න.

---

(19) හිස්කොටුවට ගැලපෙන නිඛිලය වරහන් තුළින් තෝරා ලියන්න.

☐ > -5 (-6 , -10, -3)

---

(20) එකතු කරන්න.

| | දින | පැය |
|---|---|---|
| | 10 | 17 |
| + | 12 | 10 |
| | | |

## II කොටස

**ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

(01) a) පහත ඉල්ලකම් දැක්වෙන කාඩ්පත් හතරම යොදාගෙන පසිඳු, සංඛ්‍යා පිළියෙල කරයි.

| | | | |
|---|---|---|---|
| 8 | 9 | 3 | 5 |

i. ඔහු පිළියෙල කරන ලද කුඩාම හා විශාලම සංඛ්‍යාව ලියන්න.

ii. විශාලම සංඛ්‍යාවේත් කුඩාම සංඛ්‍යාවේත් වෙනස සොයන්න.

iii. කුඩා සංඛ්‍යාවත් විශාල සංඛ්‍යාවත් එකතු කර ලැබෙන පිළිතුර ගණක රාමුවක නිරූපණය කරන්න.

b) 6735 යන සංඛ්‍යාවේ

i. 7 හි ඉලක්කමෙහි ස්ථානීය අගය ලියන්න.

ii. 3 හි ඉලක්කමේත් 6 හි ඉලක්කමේත් නිරූපණය වන අගය වෙන වෙනම ලියන්න.

iii. 6 හි ඉලක්කමෙන් නිරූපිත අගය 3 හි ඉලක්කමේ නිරූපිත අගය මෙන් කී ගුණයක් ද?

(02) a) පහත වගුව ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

↑ උ

| | | |
|---|---|---|
| a | b | c |
| d | e | f |
| g | h | i |

i. e අක්ෂරයට බස්නාහිරින් පිහිටි අක්ෂරය කුමක් ද?

ii. a අක්ෂරයට ගිනිකොණින් පිහිටි අක්ෂර 2 ක් ලියන්න.

iii. h අක්ෂරයට කුමන දිශාවෙන් d අක්ෂරය පිහිටයි ද?

b) පියල් A නගරයේ සිට 50 m ක් නැගෙනහිරට ගොස් එතැන් සිට 100m ක් දකුණු දෙසට ගොස් එතැන් සිට 50 m ක් බස්නාහිරට ගමන් කොට B නගරය වෙත පැමිණේ.

i. ඉහත විස්තරයට අනුව දළ රූපසටහනක් අඳින්න.

ii. B නගරයට කුමන දිශාවෙන් A නගරය පිහිටා ඇති ද?

iii. A හා B නගර 02 ක අතර ඇති කෙටිම දුර සොයන්න.

(03) a) පහත වගුවේ හිස්තැන් පුරවන්න.

| පැය 12 ඔරලෝසුවෙන් | සම්මත ආකාරයෙන් |
|---|---|
| පෙ:ව 1.45 | .................................... |
| ............................ | 00:30 |
| ප:ව 3.15 | .................................... |
| ............................ | 18:20 |

b) සිත්මිගේ උපන් දිනය 2007 වර්ෂයේ ජූලි මස පස්වෙනිදාය. ඇයගේ උපන්දිනය සම්මත ආකාරයට ලියන්න.

c) සුළු කරන්න.

i)

| පැය | මිනි |
|---|---|
| 10 | 40 |
| + 15 | 20 |
| | |

ii)

| දින | පැය |
|---|---|
| 20 | 10 |
| - 11 | 15 |
| | |

d) මොහොමඩ් පාසලට යාමට පිටත් වූයේ පෙ.ව. 6.35 ට ය. ඔහුට පාසලට යාමට මිනිත්තු 45 ක් ගතවන්නේ නම් ඔහු පාසලට පැමිණි වේලාව සොයන්න.

- - www.mathspapers.info - -

(04) i) -3 සිට +4 තෙක් නිඛිල සංඛ්‍යා ඇතුළත් සංඛ්‍යා රේඛාවක් අඳින්න.

ii) ඒ මත පහත සංඛ්‍යා ලකුණු කරන්න.

-3, 2, -1

iii) සංඛ්‍යා රේඛාව මත ලකුණු කළ නිඛිල ආරෝහණ පිළිවෙළට ලියන්න.

iv) හිස්කොටුවට ගැලපෙන ලෙස > හෝ < ලකුණ යොදන්න.

a) -5 ☐ -3  b) -2 ☐ 0  c) 4 ☐ -4

v) -3 ට වැඩි සෘණ නිඛිල 02 ක් ලියන්න.

(05) a) පියල්ගේ නිවසේ දිනකට දෙවරක් කිරි තේ පානය කරයි. පියල්ගේ පවුලේ සාමාජිකයින් ගණන 6 කි.

i. දිනකට සාදන කිරි තේ කෝප්ප ගණන නිමානය කරන්න.

ii. ඒ අනුව සතියකට අවශ්‍ය කිරි තේ කෝප්ප ගණන සොයන්න.

iii. පියල්ගේ නිවසේ මාසයක දී කිරි තේ සෑදීමට කිරි පැකට් 04 ක් ද තේ කොළ 500g ක් ද සීනි $1\frac{1}{2}kg$ ක් ද වැයවේ. කිරි පැකට්ටුවක් රු 325 ක් ද තේ කොළ 1kg ක් රු 450 ක් ද සීනි 1kg ක් රු. 110 ක් ද නම් මාසයකට කිරි තේ සෑදීමට වියදම් වන මුදල සොයන්න.

b) පහත දැක්වෙන්නේ නිමාලි වාර විභාගයක දී විෂයන් 03 කට ලබාගත් ලකුණුය. එම ලකුණු ආසන්න 10 ට වටයන්න.

සිංහල - 92  විද්‍යාව - 78  ගණිතය - 85

(06) a) ගුණ කරන්න.

i) 65 × 10 = ........................  ii) 316 × 9 = ..................


b) බෙදන්න.

i) 3800 ÷ 100 = ....................  ii) 9)972


c) ජේලියක පුටු 25 ක් ඇත. එවැනි ජේලි 18 ක ඇති පුටු ගණන සොයන්න.

d) පැකට් 1 ක ටොෆි 20 ක් ඇත. එවැනි පැකට් 8 ක ඇති ටොෆි ප්‍රමාණය ළමුන් 40 දෙනෙකු අතරේ සමසේ බෙදයි. එක් ළමයෙකුට ලැබෙන ටොෆි ප්‍රමාණය සොයන්න.


(07) a) පහත රූපවල දැක්වෙන කෝණ වර්ගය නම් කරන්න.

i) 


...................................

ii) 

...................................

iii) 

...................................

iv) 

...................................

b) කතුරකින් යමක් කැපීමේ දී කතුරේ තල 02 ක අතර දැකිය හැකි කෝණය කුමක් ද?

c) නිවැරදි පිළිතුර යා කරන්න.

i. ජලාශයක මතුපිට   සිරස් තලයකි.

ii. බිත්තිය

iii. දොර   ... තලයකි.

iv. පොළොව

MATHS PAPERS.INFO



ඔබට අවශ්‍ය සියලුම ගණිත ප්‍රශ්න පත්‍ර ( mathspapers.info ) වෙතින් පහසුවෙන්ම ලබාගන්න